දිනමිණ
THE DINAMINA

ලේක් හවුස්, ඩී. ආර් විජේවර්ධන මාවත, කොළඹ. ඇලි. 79811

4 වර්ෂ 1967 ක් වූ නොවැම්බර් මස 3 වැනි සිකුරාදා

# දේශබන්ධු මෙත්තානන්ද අපරාජිත සිංහලයෙක්

ප්‍රතාපවත් සිංහලයකුගේ ඇවෑමෙන් අද ලංකාව දුක් වෙයි. උදාර බෞද්ධයකුගේ ඇවෑමෙන් ලංකාව දුක් වෙයි.

ලක්ෂ සංඛ්‍යාත දිනමිණ පාඨකයන් සමඟ අපිදු මේ දුක්බර මොහොතේ, "මෙත්තානන්ද" නාමයට ආචාර කරමු.

ඔහු ගෙන නමක් නැත. එහෙත් ඔහු නමක් ඇති කෙළේය. මෙත්තානන්ද යන නම තුන් හෙළයේ හැම ගෙදරකම දන්නා හඳුනන නමක් කෙළේය. මෙත්තානන්ද නාමය හමුයේ ජනනායකයෝ වෙවුලන්නට වූහ. මෙත්තානන්ද නාමය හමුයේ පාලකයෝ ගැහෙන්නට වූහ.

ඇයි? මෙත්තානන්ද නාමය ඉදිරියේ වෙවුලන්නටත් ගැහෙන්නටත් සැලෙන්නටත් වූයේ ඇයි? පීඩිත ජනතාව වෙනුවෙන් ඔහු හෙණ ගැලී වැනි වචනයෙන් ජනනායකයනට බැණ වැදුණේය. පාලකයනට බැණ වැදුණේය. මෙත්තානන්ද කර්ණ කටුක වචනයෙන් මහා කෝලාහල එක් කළ බව සැබෑය. එමෙන්ම, පපුව කීපී ගැහෙන වචන ලියා උද්ඝෝෂණය කළ බවද සැබෑය.

## අයුක්තිය රිස්සුවේ නෑ

මෙත්තානන්ද මහතා, වචන නොබලා, වේදනා නොබලා දරුණු ලෙසම පහර ගැසුවේ, අයුක්තිය, අසාධාරණය; හා අපියාදුව අවංක හිතින්ම නොරිස්සූ හෙයිනි.

නිදහස් ලංකාවේ සිංහල බෞද්ධ ජනතාව බහු ජනතාව වුවද, ඔවුනට තැනක් නොතිබිණි. මේ දුටු මෙත්තානන්ද මහතා එය අයුක්තියක් බව රටට හඬ ගා කීය, අසාධාරණයක් බව රටට හඬ ගා කීය. අපියාදුවක් බව රටට හඬ ගා කීය.

ඒ හඬ රටට ඇසිණ. රටට ඇසෙත්ම, එතෙක් වරප්‍රසාද භුක්ති වින්දෝ, සිංහල බෞද්ධයනට වෙනස්කම් කළෝ, මෙත්තානන්ද නමට බිය වූහ. සිංහල උගතා කොන් කර සිටි අවදියකදී නැගුණු කේසර සිංහ [illegible] මෙත්තානන්ද හඬ යටපත් කරන්නට විද්‍යෝදය ලත් ඉංගිරිසි උගත් පැලැන්තියේ පිරිසක් උත්සාහ ගත් අතර, එයින් සිදුවූයේ නියම මෙත්තානන්ද කවරෙකුදැයි ඔවුනට පහර කමින්ම දැන ගැනීමට ලැබීමයි. සිංහල උගතා සමච්චලයට ලක් වෙමින් සිටි අවදියෙක එම අසාධාරණය බැලන්නැයි— වෙනස් කරන්නැයි මෙත්තානන්ද මහතා සහේතුකව පෙන්නූ කරුණු එකල ස්වදේශීය පාලක පක්ෂය විසින් පවා නොතකන ලදී.

මෙත්තානන්ද මහතාගේ දේශමාමක, ජාති මාමක ශාසන මාමක ව්‍යාපාරය හැඩගැසුණේ, මුවාත් වූණේ, තියුණුවූණේ, වෙවැනි දේශීය විදේශීය බාධක රැසක් නිසාය.

## අභීතව සටන් කළා

යටත් විජිත වාදීන්ගේ අධිරාජ්‍යවාදී යුගයේදී සුළු පිරිසක් ලබා ගත් අසාධාරණ වරප්‍රසාද නිසා තැලී පෙළී සිටි සිංහල බෞද්ධයා හිස එසවීමට කදමුරු බැඳගත්තේ මෙත්තානන්ද මහතා ප්‍රමුඛ පිරිස නායකත්වය දුන් නිසාය. අද රටවැසියා දුක් සුසුම් හෙළන්නේ ඒ නායකත්වය සිහි කරමිනි.

1956 දී මෙරට සිංහල බෞද්ධයා හා පොදු ජනතාව එක්වී කළ "නිහඬ විප්ලවය" සාර්ථක කිරීමට මෙත්තානන්ද මහතා ගත් බලවත් උත්සාහය හා මහන්සිය මේ රට ඉතිහාසයේ පරිච්ඡේදයක් වනු ඇත.

ජනතාව වෙනුවෙන් අභීතව, බලවතුන් හා සටන් කොට සිංහල බෞද්ධයාගේ උරුමයන් එළි පාදා දුන් මෙත්තානන්ද නාමය, දේශබන්ධු ඇෆ්. ආර්. සේනානායක, දේශබන්ධු පියදාස සිරිසේන, දේශබන්ධු අනගාරික ධර්මපාල, දේශබන්ධු ඩී. ආර්. විජේවර්ධන ආදී උදාර ජන නායක නාමයන් හා එක්වන්නේය.

එහෙයින් ම අපරාජිත සිංහලයන්ගේ නාමාවලියට එක්වන්නේය.